මාගේ අංකය :
ජල සම්පත් මණ්ඩලය
2026.09.03

අංශ ප්‍රධානීන් මඟින්,
සියළුම නිලධාරීන් හා නිලධාරිනියන් වෙත,

**ජල සම්පත් මණ්ඩලයේ වාර්ෂික ස්ථාන මාරු - 2027**

ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ පළාත් කාර්යාල වල හා රත්මලාන වැඩ පරිශ්‍රයේ කාර්යාල වල සේවයේ නියුතු ඔබගේ අවධානය පිණිසයි. ප්‍රධාන කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු නොදරන හා මණ්ඩලයටම එක් තනතුරක සිටින කළමනාකරුවන් හෝ නිලධාරීන් ස්ථාන මාරු ඉල්ලීමට සුදුසුකම් නොලබයි.

ඒ අනුව, ඔබගේ ස්ථාන මාරු 2027.02.01 දින සිට ක්‍රියාත්මක විය යුතු බැවින් ඒ සම්බන්ධයෙන් වන අදාළ ස්ථාන මාරු අයදුම්පත ජල සම්පත් මණ්ඩල වෙබ් අඩවියෙන් භාගත කර එහි මුද්‍රිත පිටපත අංශ ප්‍රධානී හෝ පළාත් කළමනාකරුගේ නිර්දේශ සහිතව නිසි පරිදි සම්පූර්ණ කර 2026 සැප්තැම්බර් 30 වන දින හෝ ඊට පෙර මා වෙත යොමු කිරීමට කටයුතු කරන මෙන් දන්වා සිටිමි.

තවද, 2027 වර්ෂය සඳහා පමණක් වලංගු වන ස්ථාන මාරු කාල සටහන කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

ආර්.එම්.එස්.බණ්ඩාර
සභාපති
ජල සම්පත් මණ්ඩලය

ep.

<u>කාල සටහන</u>

| කාරණය | දිනය |
|---|---|
| 1. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුව පිහිටුවීම | 2026.09.08 දිනට පෙර |
| 2. වාර්ෂිකඅභ්‍යන්තර ස්ථාන මාරු දැන්වීම පළ කිරීම | 2026.09.09 දිනට පෙර |
| 3. සම්පූර්ණ කරන ලද වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු අයදුම්පත්‍ර සභාපතිතුමා වෙත ඉදිරිපත් කිරීම | 2026.09.30 දිනට පෙර |
| 4. සභාපතිතුමා විසින් අයදුම්පත්‍ර අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුවට භාරදීම | 2026.10.02 දින |
| 5. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා සභාපතිතුමා වෙත ලිඛිතව භාරදීම. | 2026.10.31 දින |
| 6. වාර්ෂික ස්ථාන මාරු ලේඛනය ප්‍රකාශයට පත් කිරීම | 2026.11.05 ට පෙර |
| 7. වාර්ෂික ස්ථාන මාරු වලට ලැබෙන අභියාචනා භාර ගැනීමේ අවසන් දිනය හා අභියාචනා කමිටුව ප්‍රකාශයට පත් කිරීම. | 2026.11.20 ට පෙර |
| 8. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු අභියාචනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් අවසාන වාර්තාව සභාපතිතුමා වෙත භාරදීම. | 2026.12.10 ට පෙර |
| 9. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු වීම් අවසාන නියෝගය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීම හා අනුමැතිය ලබා ගැනීම. | 2026.12.25 ට පෙර |
| 10. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු වීම් නියෝගය ප්‍රකාශයට පත් කිරීම | 2026.12.31 ට පෙර |
| 11. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු නියෝගය බලාත්මක කිරීම. | 2027.02.01 දින |